**පිටබැද්දර ප්‍රාදේශීය සභාව**
**මාතර දිස්ත්‍රික්කය**

**-------------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 අප්‍රේල් 07 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 09 දින (සංශෝධිත) විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු 15 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට පිටබැද්දර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) සභාව සතු රු.940,000 ක් වූ ඉඩමේ වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) වෙන්දේසි කර තිබූ පිරිවැය රු.22,312 ක් වූ ලීබඩු උපකරණ හා සවිකිරීම්වල පිරිවැය ගිණුම් වලින් ඉවත් කර නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේදී සභාවට ලැබී තිබූ මෝටර් රථ හා කරත්තවල වටිනාකම රු.7,341,499 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ඈ) ඉඩම් හා ගොඩනැඟිලි ශේෂයට ඇතුළත් රථගාල ඉදිකිරීමේ පිරිවැය රු.230,100 ක් වැඩියෙන්ද, ආයුර්වේද ගොඩනැඟිල්ලේ පිරිවැය රු.81,524 ක් අඩුවෙන් ද දැක්වුණි.

(ඉ) කොම්පෝස්ට් අංගනය ඉදි නොකිරීම නිසා පිළිසරු ව්‍යාපෘතියට ආපසු යවා තිබූ රු.1,225,940 ක මුදල ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම

---------------------------

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ගිණුම් විෂයයන් 09 කට අදාළ ශේෂ හා ඊට අදාල උපයෝගී ලේඛන / උපලේඛන අනුව දැක්වෙන ශේෂ අතර එකතුව රු.51,718,700 ක් වූ අසමානතා නිරීක්ෂණය විය.

### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසානයට එකතුව රු.44,127,493 ක් වූ ප්‍රාග්ධන ආධාර ණයගැති ශේෂය තුළ වර්ෂ 03 ක කාලයක් ඉක්මවූ රු.26,292,259 ක ශේෂ ඇතුළත් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසානයට එකතුව රු.41,352,147 ක් වූ වියදම් ණයහිමි ශේෂය තුළ වර්ෂ 03 ක කාලයක් ඉක්මවූ රු.22,284,694 ක ශේෂ ඇතුළත් වී තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂවල සිට ඉදිරියට ගෙනෙමින් පවතින එකතු කළ අගය මත බදු ගිණුමේ වූ රු.624,939 ක ශේෂය නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් පියවර ගෙන නොතිබුණි.

(ඈ) දොරින් දොරට ගමින් ගමට ජාතික වැඩ සටහන යටතේ 2014 වර්ෂය තුළ වැඩ අවසන් කර වසර දෙකක කාලයක් ගත වී තිබූ කර්මාන්ත 10 ක් වෙනුවෙන් වූ රු.7,086,710 ක ගෙවීම් අවසන් කර නොතිබුණි.

### 1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

--------------------------------------------------

එකතුව රු. 46,619,524 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි සහ එකතුව රු.70,438,349 ක් වූ යන්ත්‍ර හා උපකරණ , මෝටර් රථ හා කරත්ත සහ ලී බඩු හා සවිකිරීම් සම්බනධයෙන් යාවත්කාලීන හා විධිමත්ව පවත්වන ලද ස්ථාවර වත්කම් ලේඛනය සහ හිමිකම් ඔප්පුද, එකතුව රු.41,352,147 ක් වූ ප්‍රාග්ධන ආධාර ණයගැති සහ වියදම් ණයහිමි ශේෂ සම්බන්ධයෙන් යාවත්කාලීන හා විධිමත්ව පවත්වන ලද ණයගැති, ණයහිමි ලේඛන හා කාල විශ්ලේෂණ යනාදී සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරිමට නොහැකි විය.

## 1.3.5 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

-----------------------------------------------------

| | |
|---|---|
| ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 ට අනුව | වර්ෂ 03 ක කාලයක් ඉකුත් වූ, රු.893,450 ක ගෙවිය යුතු රැඳවුම් තැන්පත් ශේෂ 80 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

## 02. මූල්‍ය සමාලෝචනය

----------------------

## 2.1 මූල්‍ය ප්‍රතිඵලය

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.5,368,175 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.6,205,713 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.837,538 ක පහත වැටීමක් පෙන්නුම් කෙරිණි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ මුළු පුනරාවර්තන ආදායමින් සියයට 87 ක් තරම් මුළු පුනරාවර්තන වියදම් පැවති බව නිරීක්ෂණය විය.

සභාවේ ස්වයං උත්පාදන ආදායම ඉක්මවා ඉකුත් වර්ෂ තුනෙහිම සැලකිය යුතු ඉහළ අගයන්ගෙන් පුනරාවර්තන වියදම් වැඩි වී තිබූ අත් ආදායම් ආධාර නොලැබෙන්නට සභාවට කිසිදු ආකාරයකින් ස්වයං උත්පාදන ආදායම් වලින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට නොහැකි තත්ත්වයක් පෙන්නුම් කරයි.

## 2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

------------------------------------

ජංගම හා ක්ෂණික අනුපාතයන් සාමාන්‍ය තත්ත්වයක් පෙන්නුම් කළද, ණයගැති ශේෂය තුළ වසර 03 ක කාලයක් ඉක්මවා අය නොවී පවතින රු.26,292,259 ක ශේෂ පැවතීමෙන් එම අනුපාතයන් ප්‍රකාරවම ද්‍රවශීලතා තත්ත්වයක් නොපවතින බව නිරීක්ෂණය විය.

## 2.4 ආදායම් පරිපාලනය

-----------------------

### 2.4.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

----------------------------------------

### 2.4.2 වරිපනම් හා බදු

------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) වරිපනම්

-----------

2010 පෙබරවාරි 28 දිනැති අංක 1824 දරන ගැසට් නිවේදනය මගින් සභා බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරි වසම් 10 ක් දියුණු ප්‍රදේශ ලෙස ප්‍රකාශ කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම වරිපනම් බදු අයකිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර නොතිබුණි.

(ආ) අක්කර බදු

-------------

ආරම්භක හිඟ ශේෂය රු.229,533 ක් වූ අතර, රු.32,091 ක් වූ වර්ෂයේ බිල් කිරීම් සමග රු. 261,624 ක් අය විය යුතුව තිබුණි. මුළු අයවීම් රු.3477 වීම නිසා වර්ෂය අවසානයට හිඟ ශේෂය රු.258,147 ක් විය.

### 2.4.3 බදු කුලී

---------

ආරම්භක හිඟ ශේෂය රු.1,403,418 ක් වූ අතර, රු.4,797,245 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමග රු.6,200,663 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළ මුළු අයවීම් රු.4,997,219 ක් වීම නිසා වර්ෂය අවසානයට හිඟ ශේෂය රු.1,203,444 ක් විය. හිඟ මුදල් අයකර ගැනීම සඳහා ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 2.4.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.1,715,566 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.10,978,811 ක් අයවිය යුතුව තිබුණි.

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) රු.19,015,491 ක් වූ වෙනත් ප්‍රතිපාදන යටතේ වෙළඳ පොළවල් කාමර ඉදිකිරීමේ කර්මාන්ත දෙකක වැඩ නිම කළ යුතු දිනයන් ඉක්මවා වර්ෂ දෙකකට අධික කාලයක් ගතවී තිබූ නමුත්, 2017 මැයි 25 දින වන විටත් කර්මාන්තවල වැඩ අවසන් කරවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය සභාවේ 2016 වර්ෂයට අදාළ ඇස්තමේන්තුගත ප්‍රාග්ධන වියදම රු. 53,675,000 ක් වූ නමුත්, තථ්‍ය ප්‍රාග්ධන වියදම රු. 2,187,893 ක් වූයෙන් ප්‍රාග්ධන වැඩ ඉටු කිරීමේ ප්‍රගතිය සියයට 4 ක් තරම් පහළ මට්ටමක පැවතුණි.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

#### 3.2.1 මානව සම්පත් කළමනාකරණය

තෘතීයික හා ප්‍රාථමික මට්ටමේ තනතුරුවල 11 ක් වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමට හෝ ද්විතීයික හා ප්‍රාථමික මට්ටමේ තනතුරුවල පවතින පුරප්පාඩු 04 ක් පුරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

#### 3.2.2 නඩු ගාස්තු ගෙවීම

සභාවට එරෙහිව පවරා ඇති නඩු 02 ක් සඳහා 2015 වර්ෂයේ සිට නඩු වාර 33 ක් වෙනුවෙන් එකම නීතිඥවරයෙකුට රු.1,394,500 ක මුදලක් ගෙවා තිබූ අතර, නීතිඥ ගාස්තු ගෙවීමේ නිසි ක්‍රමවේදයක් නොතිබුණි.

#### 3.2.3 දේපළ ණයපොලී

සභාවේ නිලධාරීන් ලබාගත් දේපළ ණය සඳහා වූ බැංකු පොලියේ රු.234,515 ක වෙනස පළාත් පාලන කොමසාරිස් විසින් සමාලෝචිත වර්ෂයේ අවසානයට ද ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

----------------------------

ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩ සටහන යටතේ 2016 වර්ෂය තුළ ව්‍යාපෘති 06 ක් සඳහා අනුමත වී තිබුණු රු.2,050,000 ක ප්‍රතිපාදනවලින් ලබා දී තිබූ රු. 1,000,000 ක අත්තිකාරම් මුදල් යොදවා රු.600,000 ක් වූ ව්‍යාපෘති 02 ක් පමණක් ඉටු කර තිබුණි. රු.1,450,000 ක් වූ ඉතිරි ව්‍යාපාති 04 ඉටු නොකිරීම නිසා අදාළ ප්‍රතිපාදන ලැබී නොතිබුණි.

**3.4 ව්‍යාපෘති ප්‍රමාද කිරීම**

-----------------------

දකුණු පළාත් සංවර්ධන සැලැස්ම - මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ 2013 වර්ෂයේ සිට 2016 වැඩ සටහන සඳහා සභාවට ලැබී තිබූ රු.210,000 ට අදාළ කර්මාන්ත 05 ක් 2017 මැයි 31 දින වන තෙක් ක්‍රියාත්මක කර නොතිබුණි.

**3.5 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) දෛනිකව එකතු කරනු ලබන දිරන කසළ ප්‍රමාණය පෞද්ගලික පොහොර නිෂ්පාදකයන් 06 දෙනෙකුට නොමිලේ භාරදීමට කටයුතු කර තිබුණි.

(ආ) 2015 අප්‍රේල් 22 දින රු.83,984 ක මිනුම් ගාස්තු ගෙවා හෙක්ටයාර 8.4266 ක ඉඩමක් ලබාගෙන තිබුණද, එම ඉඩම කසල බැහැර කිරීම සඳහා යොදා ගෙන නොතිබුණි.

(ඇ) කොම්පෝස්ට් අංගනය ඉදි නොකිරීම නිසා පිළිසරු ව්‍යාපෘතිය යටතේ ලබාදී තිබූ රු.1,225,940 ක මුදල නැවත ලබාගෙන තිබුණි.

**04. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

----------------------------------------

**4.1 අයවැය පාලනය**

------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. සීමාව ඉක්මවා වියදම් විෂයයක් යටතේ රු.878,591 ක වියදම් දැරීමද, වියදම් විෂයයන් 07 ක එකතුව රු.4,118,254 ක් වූ ඉතිරි කිරීමද, ආදායම් විෂයයන් 03 ක ළඟා කර නොගත් ඉලක්කවල එකතුව රු.1,409,345 ක් ද, පැවතිව නිසා.

**4.2 අභ්‍යන්තර විගණනය**

------------------------

ශ්‍රී ලංකා රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 133 හා 134 යන රෙගුලාසිවල දැක්වෙන විධිවිධානයන් සහ දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ. දරන චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණ නමුත්, සභාව විසින් පත්කර තිබූ අභ්‍යන්තර විගණන නිලධාරියාට සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා ලෙස රු.421,185 ක මුදලක් ගෙවා තිබුණි.

**4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

---------------------------------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

**5. පද්ධති හා පාලනයන්**

-----------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් රැස්කිරීම

(ඈ) වත්කම් කළමනාකරණය